25 . 07 . 2016

මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2016

## චිත්‍ර කලාව

විභාග අංකය: ..............................................

| 10 ශ්‍රේණිය | I පත්‍රය | කාලය පැය 01 යි. |
| --- | --- | --- |

**සැලකිය යුතුයි.**

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් පිළිපදින්න.
- සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.



- ඉහත දැක්වෙන කලා නිර්මාණය හඳුනාගෙන අංක 01 සිට 05 දක්වා දී ඇති හිස්තැන් පුරවන්න.

ඉහත දැක්වෙන චිත්‍රය (01) ...................................... රජ දවස (02) ...................................... රජ මහා විහාරයේ (03) ...................................... විසින් විහාරයේ ගර්භ ගෘහයට ඇතුල්වන දොරටුව දෙපස ඇති තීරු චිත්‍ර අතර චිත්‍රණය කර ඇති (04) ...................................... තුළ ගැබ් ව ඇති (05) ...................................... දැක්වෙන චිත්‍රයයි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැන ට ගැළපෙන නිවැරදි පිළිතුර ලියන්න.

06. වෙස් මුහුණු නිර්මාණය කිරීමේ දී ලී කඳක් කපා පොතු ගසා කැබලිවලට කපා ගැනීම ...................................... ...................................... ලෙස හඳුන්වයි.

07. ඉන්දීය සාරානාත් බුද්ධ ප්‍රතිමාවේ නිරූපිත ආසන ක්‍රමය ...................................... නමින් හැඳින්වේ.

08. දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම යොදා ගනිමින් නිර්මාණය කළ ගඩලාදෙණි විහාරයේ නිර්මාණ ශිල්පියා ...................................... ලෙස සඳහන් වී ඇත.

09. දළ බෑවුමක් සහිත වහලය, තුඩු ආරුක්කු සහිත කවුළු ඇති ක්‍රිස්තු දේවස්ථාන අයත් වන්නේ ...................................... වාස්තු විද්‍යා ශිල්පයට ය.

10. ඉසුරුමුණි විහාරයේ දක්නට ලැබෙන කැටයම් අතුරින් ගුප්ත සම්ප්‍රදායේ ලක්ෂණ ඇතිව නිර්මාණය වූ සුවිශේෂී කැටයම ...................................... නමින් හැඳින්වේ.

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නය ට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

11. හින්දු කලා ලක්ෂණ හා පිකාසෝ ශිල්පියාගේ ඝනිකවාදී ශෛලිය ලක්ෂණ අභාසය කර ගනිමින් ජෝර්ජ් කීට් ශිල්පියා විසින් ගෝතමී විහාරයේ ඇඳ ඇති සිතුවම වන්නේ,
   (1) හේමමාලා කුමරිය හා දන්ත කුමරු සිතුවමයි.
   (2) මාර පරාජය සිතුවමයි.
   (3) පියුම් පිට වැඩීම සිතුවමයි.
   (4) සිදුහත් කුමරු හා මව් බිසව සිතුවමයි.


12. මැදවල ටැම්පිට විහාරය තුළ සිතුවම් කොට ඇති නිර්මාණ ආශ්‍රිත දකිය හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
   (1) පාර්ශව දර්ශී රූප.
   (2) ප්‍රෙස්කෝ බුවනෝ ශිල්ප ක්‍රමය භාවිතය.
   (3) කාන්තා යුගල රූප බහුල වශයෙන් සිත්තම් කර තිබීම.
   (4) ජාතක කතා පමණක් සිතුවම් කර තිබීම.

13. ජනතාවගේ මහත් ගෞරවයට පාත්‍ර වූ බුදු පහස ලැබූ ධාන්‍යාකාර හැඩයෙන් යුතු දාගැබ,
   (1) මිහින්තලේ කණ්ඨක චෛත්‍යය (2) අනුරාධපුර ස්වර්ණමාලී චෛත්‍යය
   (3) කැලණිය චෛත්‍යය (4) මිරිසවැටිය චෛත්‍යය

14. බොහෝ හින්දු දේවාලවල දැකගත හැකි ශිව දෙවියන්ගේ වාහනය ලෙස පූජනීයත්වයෙන් වැඳුම් පිදුම් ලබන්නේ,
   (1) නන්දි ගවයාගේ රූපයයි. (2) මොනර රූපයයි.
   (3) හංස රූපයයි. (4) අශ්ව රූපයයි.


15. පිත්තල කර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කීපයක ප්‍රචලිත ව පවත්නා පාරම්පරික කලා කර්මාන්තයකි. එම කර්මාන්තය ප්‍රචලිත ව පවත්නා ප්‍රදේශයක් නොවන්නේ,
   (1) පිළිමතලාව (2) කිරිවවුල
   (3) නත්තරන් පොත (කලාපුරය) (4) අම්බලන්ගොඩ

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති රූප සටහන් කොටස්වලට සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියෙන් ඇති A,B,C,D,E යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉරි මත ලියන්න.

11. 


(..........................)



A. 

12. 

(..........................)

B. 

13.  (..........................) C. 

14.  (..........................) D. 

15.  (..........................) E. 

- අංක 21 සිට 25 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සපයන්න.

21. කාන්තා රූප පහක් ගළපා කළ ගෙඩියක ආකාරය නිරූපණය වන සේ නිර්මාණය කර ඇති සැරසිල්ල කුමන නමකින් හැඳින්වේ ද? ..............................................................

22. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ ප්‍රකාශය ට අනුව සීගිරි බිතු සිතුවම් අතර ඇති යුගල රූප මගින් සංකේතවත් කර ඇත්තේ කුමක් ද? ..............................................................

23. නිල්, කහ, රතු මූලික වර්ණ වන අතර උෂ්ණ වර්ණ හා සීත වර්ණ යනුවෙන් ද වර්ණ වෙන් කල හැකිය. සංගත වර්ණ යනු කුමක් ද?
..............................................................

24. ගණිතය, විද්‍යාව, ඉංජිනේරු ශිල්පය, සංගීතය. ගෘහ නිර්මාණ ශිල්පය මෙන්ම සැලසුම් ශිල්පයට ද, දස්කම් දක්වා ඇති, පුනරුද යුගයේ බිහි වූ ශ්‍රේෂ්ටතම චිත්‍ර ශිල්පියා කවුද?
..............................................................

25. මයිකල් ඇන්ජලෝ ශිල්පියා විසින් "කිරිගරුඬ" මාධ්‍යයෙන් තෙලා ඇති පියෙටා මූර්තියෙහි ශිල්ප ක්‍රමය කුමක් ද? ..............................................................

- අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J, යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F




G



H



I



J

26. F අක්ෂරයෙන් දැක්වෙන කල්පිත රූපය ලාංඡනයක් ලෙස යොදා ගෙන ඇත්තේ කුමකට ද?

..........................................................................................................

27. G අක්ෂරයෙන් දක්වා ඇත්තේ පොළොන්නරුවේ උත්තරාරාමයේ පිහිටි තනි කලු ගලේ නිර්මාණය කර ඇති හිටි පිළිමයයි. මෙහි දක්වෙන මුද්‍රාව හඳුන්වන්නේ කුමන නමකින් ද?

..........................................................................................................

28. ගම්පොළ යුගයේ ඉදි වූ ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයමක් H අක්ෂරයෙන් දක්වා ඇත. මෙයින් නිරූපණය කර ඇත්තේ කවරෙකු ද?

..........................................................................................................

29. I අක්ෂරයෙන් දක්වෙන සිතුවම නිර්මාණය කර ඇති පොළොන්නරු යුගයේ දී ඉදි වූ සුවිශේෂී බෞද්ධ මන්දිරය කුමක් ද?

..........................................................................................................

30. J අක්ෂරයෙන් දක්වෙන ප්‍රාග් ඓතිහාසික සිතුවම කුමක් ද?

..........................................................................................................

- ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

31. ගෝපුරම් ..........................................................................................

..........................................................................................

32. සාදිලිංගම් ..........................................................................................

..........................................................................................

33. ටෙම්පරා ..........................................................................................

..........................................................................................

34. දෙල්මඩමුලාචාරි ..........................................................................................

..........................................................................................

35. අල්පනාව ..........................................................................................

..........................................................................................

25.07.2016

Learning Resource Center

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# චිත්‍ර කලාව

විභාග අංකය: ..........................................................

| 10 ශ්‍රේණිය | III පත්‍රය | කාලය පැය 02 යි. |
|---|---|---|

- පහත "අ" "ආ" "ඉ" යන කොටස් අතුරෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

(අ) කොටස

<u>චිත්‍ර සංරචනය</u>

01. වැල්ලට ඔරු ඇවිල්ලා
02. ශ්‍රමදාන අවස්ථාවක්
03. ජන ක්‍රීඩාවක සිත්ගත් අවස්ථාවක්
04. නිදහසේ සැරිසරන වනසතුන්

(ආ) කොටස

<u>මෝස්තර නිර්මාණය</u>

05 මල් සහ කොළ ඇසුරු කරගෙන චීත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
06. මේස රෙද්දක පහළ වාටිය සැරසීමට සුදුසු වාටි මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.
07. නවතම හැඩයේ මැටි බඳුනක් ඇඳ ගැළපෙන මෝස්තර යොදා වර්ණ කරන්න.
08. නිවසේ සාලයේ පාවිච්චි කිරීමට සුදුසු බුමුතුරුණක් සඳහා මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න. (අඟල් 7 X 7)

(ඉ) කොටස

<u>ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය</u>

09. "ඩෙංගු උවදුර වළකමු" යන්න තේමා කරගත් පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. ළමා කතන්දර පොතක ට සුදුසු පිට කවරයක් සැලසුම් කර වර්ණ කරන්න.
11. අලුතින් හඳුන්වා දෙන බැංකුවක් සඳහා ලාංඡනයක් නිර්මාණය කර සුදුසු වර්ණ යොදන්න. (වර්ණ තුනකට සීමා කරන්න.)
12. වෙළෙඳපොළට අලුතින් හඳුන්වාදීමට නියමිත සබන් වර්ගයක දවටනයක් සඳහා සුදුසු සැලසුමක් ඇඳ වර්ණ කරන්න. (සුදුසු සංකේත භාවිත කරන්න.)

(ලකුණු 30 යි.)